# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
**Co-operative Employees Commission (Southern Province)**

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } SP/CEC/1/O/09 | ඔබේ අංකය / உனது இல / Your No. } | දිනය / திகதி / Date } 2022.10.05 |

චක්‍රලේඛ අංක 02/2022(II)

දකුණු පළාතේ සියළුම සමුපකාරවල සභාපතිවරුන් වෙත,

<u>**දකුණු පළාතේ සියළුම සමුපකාර සමිති/සංගම් වල සේවකයින්ගේ තනතුරු, වැටුප් පරිමාණ සහ සුදුසුකම්.**</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2022.04.27 දිනැතිව නිකුත් කරනු ලැබූ 02/2022 සම්බන්ධයෙන් දකුණු පළාතේ සමුපකාර සමිති/සංගම් විසින් එම චක්‍රලේඛයේ 12 වන වගන්තිය යටතේ සේවක අන්තර්ග්‍රහණය හා වැටුප් පරිවර්තනය කිරීමේදී අනුගමනය කරනු ලබන පියවර පිළිබඳව වැඩිදුර පැහැදිලි කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

2.1 සේවක අන්තර්ග්‍රහණය සඳහා සේවකයින්ගේ සේවා කාලය සළකා බැලීමේදී සතුටුදායක සේවා කාලය සළකා බැලිය යුතු අතර, අනුමත පිරිස්බල තක්සේරුවේ සඳහන් තනතුරෙහි ස්ථිරව එම තනතුරට බඳවා ගනිමින් පත්වීම් ලිපියක් නිකුත් කළ දිනය හෝ වැඩභාරගත් දිනය යන දෙකින් පසුව එළඹෙන දිනය පදනම් කර ගනිමින් සේවා කාලය ගණනය කළ යුතුය.

2.2 එහෙත්, ඇතැම් ප්‍රාථමික මට්ටමේ සමිති සඳහා ආරම්භක අවස්ථාවේදී පිරිස්බල තක්සේරුව අනුමත වී නොමැති අතර, සේවකයින් බඳවා ගැනීම් සිදු කර, යම් දීමනාවක් මත සේවකයින් සේවයේ යොදවා ඇති සමිති/සංගම් විසින් පිරිස් බල තක්සේරුව අනුමත වීමෙන් පසු එම සේවකයින්ගේ සේවා කාලය ගණනය කිරීමේදී 2019.01.28 දිනැතිව නිකුත් කර ඇති 01/2019 චක්‍රලේඛය අනුව මේ වන විට පිහිටුවා ඇති වැටුප් පියවර පදනම් කර ගත යුතුය. පිරිස්බල තක්සේරුව අනුමත වුව ද කොමිෂන් සභාවේ පත්වීම් අනුමැතිය ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම මත අගතියක් වී ඇති සේවකයින්ගේ සේවා කාලය ගණනය කිරීමේදී පිරිස්බල තක්සේරුව අනුමත වූ දිනය පදනම් කර ගත යුතුය.

2.3 02/2022 චක්‍රලේඛයේ 12 (II) වගන්තිය අනුව සේවකයින් අදාළ තනතුරට හා ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමේදී යම් වැටුප් විෂමතාවයක් වේ නම්, එම සේවකයාට පෞද්ගලික වන සේ අතිරේක වැටුප් වර්ධක ලබා දී අදාළ විෂමතාවය නිවැරදි කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය/කාරක සභාව සතු වුවත්, එසේ ගනු ලබන තීරණය සම්බන්ධව සාධාරණීයකරන වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර, ඒ සඳහා පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය.

ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත

ජයන්ත ජී. ලියනගේ,
ලේකම් (වැ.බ),
සමුපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත් :-
01. ප්‍රධාන ලේකම්, දකුණු පළාත
02. ලේකම්, කෘෂිකර්ම ගොවිජන සංවර්ධන....සමුපකාර අමාත්‍යාංශය - දකුණු පළාත
03. සමුපකාර සංවර්ධන කොමසාරිස් / රෙජිස්ට්‍රාර් - දකුණු පළාත.
04. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
05. පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
06. චක්‍රලේඛ ගොනුවට


ලේකම් / செயலாளர் / Secretary } 091-2232794 | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer } 091-2234279 | කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax } 091-2234383 | වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site } www.cec.sp.gov.lk | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail } empcommicoopsp@sltnet.lk